සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education NWP

29 | S | I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය ............................ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I කාලය පැය දෙකයි

- **අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. පෙර පාසල් අවධියේ සිට මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බවට නිර්දේශ කර ඇත්තේ,
    1. ඉලිනොයිස් විශ්වවිද්‍යාල ය.
    2. දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලය ය.
    3. යුනෙස්කෝ සංවිධානය ය.
    4. ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ය.
    5. මානව හිමිකම් සංවිධානය ය.

02. සන්නිවේදන විෂයය ස්වාධීන විෂයය ක්ෂේත්‍රයක් ලෙස බිහිවීමට ප්‍රථම වෙනත් විෂයය ක්ෂේත්‍රයන් යටතේ අන්තර්ගත වී තිබිණි. එම විෂයය ක්ෂේත්‍ර වන්නේ,
    1. මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව හා අපරාධ විද්‍යාව ය.
    2. දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව හා සමාජ විද්‍යාව ය.
    3. දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව හා මනෝ විද්‍යාව ය.
    4. දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව හා ආර්ථික විද්‍යාව ය.
    5. මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව හා අපරාධ විද්‍යාව ය.

03. 'පුවත්පත් කලාව' යනුවෙන් පාඨමාලාවක් ආරම්භ කර ඇත්තේ,
    1. දෙහිවල කනිෂ්ඨ විශ්ව විද්‍යාලයේ ය.
    2. කැළණිය විශ්ව විද්‍යාලයේ ය.
    3. ලේක් හවුස් ආයතනයේ ය.
    4. කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ය.
    5. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ය.

04. විවිධ ප්‍රදේශ, වෘත්තීන්, සංස්කෘතීන් අනුව යොදාගනු ලබන සන්නිවේදන රටාව වෙනස් ය. එමගින් නිරූපණය වන සන්නිවේදනයේ ස්වභාවය වන්නේ,
    1. විවිධාකාර බවයි.
    2. සංකේතාත්මක බවයි.
    3. අරමුණු සහගත බවයි.
    4. සන්දර්භානුගත බවයි.
    5. ක්‍රියා පටිපාටියක් බවයි.

05. සන්නිවේදන ක්‍රියාවලියක දී සන්නිවේදක ස්ථානය නියෝජනය කරන්නේ,
    1. තනි පුද්ගලයෙක් ය.
    2. කණ්ඩායමක් ය.
    3. ආයතනයක් ය.
    4. සංවිධානයක් ය.
    5. ඉහත සියල්ලන්ම ය.

06. මානව සම්බන්ධතා රඳවා ගැනීමට සන්නිවේදනය ඉවහල් වන බව සිය අර්ථ කථනය තුළින් ඉදිරිපත් කළේ,
    1. චාල්ස් කූලී ය.
    2. ෂැනෝන් හා වීවර් ය.
    3. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
    4. විල්බර් ශ්‍රාම් ය.
    5. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය ය.

07. සන්නිවේදන මූලිකාංගවලට අයත් වන වරණය වන්නේ,
    1. ආකේතිකරය, විකේතිකරය, අර්ථකථනය, ප්‍රජානනයයි
    2. සන්නිවේදකයා, ග්‍රාහකයා, පාඨකයා, සංදේශයයි.
    3. ආකේතිකරණය, විකේතිකරණය, අත්දැකීම් පසුතලය, සන්දර්භයයි.
    4. සන්දර්භය, බලපෑම, පෙළඹවීම, ප්‍රතිපෝෂණයයි.
    5. ශ්‍රාවකයා, සන්නිවේදකයා, සංදේශය, නාලිකාවයි.

- **පහත දක්වා ඇති සන්නිවේදන අංග ඇසුරින් 8 - 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | |
|---|---|---|---|
| A අර්ථ නිරූපණය | B බාධක | C කථකයා | D ග්‍රාහකයා |
| E සංදේශය | F බලපෑම | G ආකේතිකරය | H ප්‍රතිපෝෂණය |
| I කථාව | J විකේතිකරය | K සන්නිවේදකයා | L අවස්ථාව |

08. චක්‍රීය සන්නිවේදන ක්‍රියාවලියක් සිදුවීමට අවශ්‍ය අංග ඇතුළත් වරණය තෝරන්න.
1. A, D, K, H 2. A, G, J, E 3. G, J, A, F
4. J, G, E, F 5. G, A, D, J

09. සන්නිවේදන ක්‍රියාවලිය අසාර්ථක වීම කෙරෙහි බලපාන අංගයක් වන්නේ,
1. G ය. 2. K ය. 3. D ය. 4. B ය 5. E ය.

10. ඉහත අංග අතුරෙන් ඇරිස්ටෝටල් ආකෘතියට අයත් නොවන අංග තුනක් වන්නේ,
1. C, E, L 2. C, I, K 3. E, I, L
4. E, K, B 5. F, I, L

11. සන්නිවේදනයේ කාර්ය භාරයන් පිළිබඳව ඉදිරිපත් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A තොරතුරු සම්පාදන කාර්යයේ ගුණාත්මකභාවය කෙරෙහි තොරතුරුවල කාලීන බව වැදගත් වේ.
B වර්තමානයේ තොරතුරු සම්පාදන කාර්යය වෙළඳ මුහුණුවරක් ගෙන ඇත.
C පුවත්පත් කාටූන් මගින් විනෝදාස්වාද සම්පාදන කාර්යය පමණක් සිදුවේ.
D විනෝදාස්වාදය මෙන් ම අධ්‍යාපන කාර්ය ද එකම ක්‍රියාවක් මඟින් ඉටු කර ගත හැකිය.
ඉහත ප්‍රකාශ අතුරින්,

1. A සත්‍ය වේ. BCD අසත්‍ය වේ. 2. C සත්‍ය වේ. ABD අසත්‍ය වේ.
3. B,D සත්‍ය වේ. AC අසත්‍ය වේ. 4. A,C සත්‍ය වේ. BD අසත්‍ය වේ.
5. A,B සත්‍ය වේ. CD අසත්‍ය වේ.

12. කුමාරි පුවත්පතක පළ කර තිබූ මනාලියන් හැඩගැන්වීමේ වැඩමුළුවකට සහභාගී වූවාය. ඇය සම්බන්ධ වූ සන්නිවේදන වර්ගය වන්නේ,
1. සමූහ සන්නිවේදනයයි. 2. මහජන සන්නිවේදනයයි. 3. අතථ්‍ය සන්නිවේදනයයි.
4. අන්තර් පුද්ගල සන්නිවේදනයයි. 5. ජන සන්නිවේදනයයි.

13. උත්සව ශාලාවට පැමිණි ආරාධිත අමුත්තා තමාට වෙන් කර තිබූ ආසනය සොයා අසුන් ගත්තේ ය. ඒ සඳහා ඔහුට උපකාරී වූ සන්නිවේදන ස්වරූපයට වන්නේ,
1. වාචික සන්නිවේදනයයි. 2. අවාචික සන්නිවේදනයයි.
3. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි. 4. අතථ්‍ය සන්නිවේදනයයි.
5. දෘශ්‍ය සන්නිවේදනයයි.

14. තෙන්මෝඩි, වඩිමෝඩි, යන හින්දු සංස්කෘතියට අනුගත ශාන්ති කර්ම භාවිත කිරීමේ අරමුණ වන්නේ,
1. අපල උපද්‍රවයන්ගෙන් මිදීමයි. 2. සශ්‍රීකත්වය වර්ධනය කර ගැනීමයි.
3. විනෝදාස්වාදය ලබා ගැනීමයි. 4. රෝගවලින් අත්මිදීමයි.
5. දේව ආශිර්වාද ලබා ගැනීමයි.

15. ජන මාධ්‍ය මගින් ඉටු කරන භූමිකා කිහිපයක් පහත දැක්වේ.
A ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මුර සෙබලෙකුගේ භූමිකාව
B ආරක්ෂකයෙකුගේ භූමිකාව
C රාජ්‍ය උපදේශකවරයෙකුගේ භූමිකාව
D ගුරුවරයෙකුගේ භූමිකාව
E සාකච්ඡා මණ්ඩපයක භූමිකාව
F සමාජ හා පරිසර උරුමයන් ආරක්ෂා කරන්නෙකුගේ භූමිකාව
විල්බර් ශ්‍රාම් ජනමාධ්‍ය ඉටු කල යුතු ප්‍රධාන භූමිකා ලෙස ඉහත කරුණු අතරින් දක්වා ඇත්තේ,
1. A, D, E, ය 2. B, D, E ය 3. B, C, D ය
4. D, E, F ය 5. A ,E , F ය

16. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය එකම මාධ්‍යයක් තුළ ඒකාබද්ධ වීම, මාධ්‍ය
    1. ජාලගතකරණයයි.  2. අංකිතකරණයයි.
    3. අභිසාරිතාවයයි.  4. නිෂ්කර්ෂණයයි.
    5. සමාජානුයෝජනයයි.

17. වරුණි රැකියාවක් අපේක්ෂිත තරුණියකි. ඒ සඳහා ඇයට ජාලගත වීමට සුදුසු සමාජ මාධ්‍ය යෙදවුම වන්නේ,
    1. Twitter  2. Pinterest  3. Viber
    4. Linkedin  5. Instagram

18. සමාජ මාධ්‍ය මඟින් පුද්ගලයෙකුට ඇති කරන අහිතකර ප්‍රතිවිපාකය වන්නේ,
    1. දේශීය අනන්‍යතාවය විනාශ කිරීමයි.
    2. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමයි.
    3. සයිබර් හිරිහැර හා උවදුරු ඇති කිරීමයි.
    4. පෞද්ගලික තොරතුරු අන් අයට ලබා දීමයි.
    5. ගැඹුරු මානසික හා සමාජ කම්පන ඇති කිරීමයි.

19. සම්භාව්‍ය සංස්කෘතික කලා නිර්මාණවලට ප්‍රතිවිරුද්ධ ලකෂණ දැකිය හැකි සංස්කෘතික ප්‍රභේදය වන්නේ,
    1. ජනප්‍රිය සංස්කෘතියේ ය.
    2. මාධ්‍ය සංස්කෘතියේ ය.
    3. ගෝලීය සංස්කෘතියේ ය.
    4. සාම්ප්‍රදායික සංස්කෘතියේ ය.
    5. ජන සංස්කෘතියේ ය.

20. විවිධ සංස්කෘතීන් පිළිබඳව අධ්‍යයනය කිරීමේ මූලික අරමුණ විය යුත්තේ,
    1. දැනුම ලබා ගැනීමයි.
    2. සංස්කෘතීන් අතර ඇති විවිධතා හඳුනා ගැනීමයි.
    3. විවිධ සංස්කෘතික පුද්ගල කණ්ඩායම් සමඟ සමාජ සබඳතා ඇති කර ගැනීමයි.
    4. මානව සබඳතා හා සංස්කෘතික සුවිශේෂතා හඳුනා ගැනීමයි.
    5. තම සංස්කෘතියේ විශිෂ්ටත්වය හඳුනා ගැනීමයි.

21. සමාජ විඥානය හා පුද්ගල විඥානය වෙනස් කිරීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ,
    1 මාධ්‍ය තාක්ෂණයේ වර්ධනයයි.  2. ගෝලියකරණයේ බලපෑමයි.
    3. සංස්කෘතියේ ගතික ස්වභාවයයි  4. අන්තර් සංස්කෘතික සබැඳියාවයි.
    5. තොරතුරු සංස්කෘතියේ බලපෑමයි.

22. නව මාධ්‍ය මඟින් සිදුවන අයහපත් සමාජ බලපෑම් අවම කිරිමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයකි.
    1. මාධ්‍ය භාවිතයෙන් පුද්ගලයා දුරස් කිරීම.  2. විකල්ප මාධ්‍ය හඳුන්වා දීම.
    3. තහනම් කිරීම  4. නීති රීති සකස් කර ක්‍රියාත්මක කිරීම.
    5. සිදුවන ආදීනව පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම.

23. මාධ්‍ය සාක්ෂරතාවය යන්නට නිවැරදි අර්ථ කථනය තෝරන්න.
    1. භාෂාවක් ලිවීමට හා කියවීමට ඇති හැකියාවයි.
    2. මාධ්‍ය සංදේශ විචාරශීලිව වටහා ගැනීමේ හැකියාවයි.
    3. මාධ්‍ය සංදේශ අර්ථ කථනය කිරීමේ හැකියාවයි.
    4. ඕනෑම මාධ්‍යයක් මඟින් ලබා දෙන සංදේශ පරිහරණයට, විශ්ලේෂණයට, ඇගයීමට, නිර්මාණකරණට ඇති හැකියාවයි.
    5. ශ්‍රව්‍ය, දෘශ්‍ය, ලිඛිත මාධ්‍ය මඟින් ලබා දෙන සංදේශ ග්‍රහණය කර අවබෝධ කර ගැනීමේ හැකියාවයි.

24. රූපවාහිනී වෙළඳ දැන්වීමක් මඟින් ඉදිරිපත් කළ ආලේපන වර්ගයක් මිලදී ගැනීම සඳහා කුමාරී පෙළඹීමට හේතු වූයේ,
    1. දැන්වීමේ ආකර්ෂණීය බව නිසා ය.  2. ස්ව කේන්ද්‍රය අවිඥානිකව ක්‍රියාත්මක වීම නිසා ය.
    3. ස්ව කේන්ද්‍රයක් නොතිබීම නිසා ය.  4. ඥාන ව්‍යුහය සකස් වී නොතිබීම නිසාය.
    5. අන්තර්වර්ති පුද්ගල නිපුණතා වර්ධනය වී නොතිබීම නිසා ය.

25. මාධ්‍ය විචාරයේ මූලිකාංගයක් නොවන්නේ,
1. නිර්මාණකරුවා
2. නිර්මාණය
3. නිර්මාණය රසවිඳින ග්‍රාහකයා
4. නිර්මාණාත්මක චින්තනය
5. නිර්මාණාත්මක රචනය

26. මාධ්‍ය විචාරයේ අරමුණ වන්නේ,
1. සංදේශය විවේචනය කිරීමයි.
2. සංදේශයේ ගුණදොස් පෙන්වා දීමයි.
3. සංදේශ රචකයන් දිරි ගැන්වීමයි.
4. පුද්ගල ස්ව කේන්ද්‍රයට සිදුවන බලපෑම් ඉවත් කිරීමයි.
5. පුද්ගල පරිකල්පනය ඇති කිරීමයි.

27. මාධ්‍ය සංදේශයක් විශ්ලේෂණය කිරීමේ දී අවම අවධානයක් යොමු වන්නේ,
1. පක්ෂපාතිත්වය කෙරෙහි ය.
2. නිවැරදි බව කෙරෙහි ය.
3. අදාළ බව කෙරෙහි ය.
4. විශ්වසනීයත්වය කෙරෙහි ය.
5. ඒකාකෘතික බව කෙරෙහි ය.

28. ජනකණ්ඩායම් බිහිවීම කෙරෙහි මූලික වශයෙන් බලපා ඇත්තේ,
1. සංස්කෘතියයි.
2. ආගමයි
3. භාෂාවයි.
4. ජාතියයි.
5. ඇඳුම් ආම්පන්නයි.

29. භාෂාවේ නිර්මාණශීලිත්වය ප්‍රබල වශයෙන් දැකිය හැක්කේ,
1. විශේෂාංග ලිපිවල ය.
2. පුරාණ සාහිත්‍යයේ ය.
3. තීරු ලිපිවලය.
4. නිර්මාණාත්මක සාහිත්‍යයේ ය.
5. නව මාධ්‍යයේ ය.

30. ඒක මාර්ගික සන්නිවේදනයක් ක්‍රියාත්මක වන මහජන සම්බන්ධතා මෙවලමකි.
1. දිරි දීමනා
2. උපදේශනය
3. අරමුදල් ලබා දීම
4. උසස්වීම් ලබා දීම
5. විස්තර පත්‍රිකා ලබා දීම

31. කිසියම් ආයතනයක් හා එහි පාර්ශවකරුවන් අතර මතභේදාත්මක තත්වයක් ඇති වූ විට මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා තොරතුරු හෙළි කිරීම මහජන සම්බන්ධතා උපක්‍රමයකි. මාධ්‍යකරුවාගේ දෘෂ්ටිකෝණයෙන් එය වැදගත් වන්නේ,
1. ආයතනය විසින් ම ආරාධනා කරන බැවිනි.
2. මාධ්‍ය වාර්තාකරණය සඳහා පහසුවෙන් තොරතුරු ලැබෙන බැවිනි.
3. ආයතන නිළධාරීන් මුහුණට මුහුණ හමු වී කථා කළ හැකි බැවිනි.
4. ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලැබෙන බැවිනි.
5. නිල තොරතුරු ලබාගත හැකි බැවිනි.

32. ආයතනයකට වෘත්තීමය මහජන සම්බන්ධතා නිළධාරීන් පත් කිරීමේ අරමුණ වන්නේ,
1. රැකියා අවස්ථා සම්පාදනයයි.
2. බාහිර ප්‍රජාව වෙත තොරතුරු සපයාදෙමින් ආයතනය වෙත ඔවුන් රඳවා තබා ගැනීමයි.
3. සැලසුම් සකස්කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වීමයි.
4. ඉහළ කළමනාකරණ හැකියාවක් පැවතීමයි.
5. සේවක සංඛ්‍යාව වැඩි කිරීම තුළින් ආයතනයේ ජනප්‍රියභාවය වර්ධනය කිරීමයි.

33. රටක සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවම අවධානයක් යොමු විය යුත්තේ,
1. තාක්ෂණික ක්‍රම භාවිතය කෙරෙහි ය.
2. ජනතා කේන්ද්‍රීය බව කෙරෙහි ය.
3. ප්‍රාදේශීයකරණය කෙරෙහි ය.
4. දරිද්‍රතා මට්ටම් කෙරෙහි ය.
5. ජනතා සහභාගීත්වය කෙරෙහි ය.

34. සංවර්ධනය සඳහා සන්නිවේදනය භාවිතයේ දී තාක්ෂණික ක්‍රම භාවිතය හා ප්‍රජා මූලික ගුවන්විදුලි වැඩසටහන් භාවිතා කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබුයේ,
1. ආහාර හා කෘෂිකර්ම සංවිධානයයි.
2. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනය හා සංස්කෘතික සංවිධානයයි.
3. යුනෙස්කෝ සංවිධානයයි.
4. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි.
5. සාක් සංවිධානයයි.

35. තිරසර සංවර්ධන වැඩසටහන් දියත් කිරීම සෑම රටකම අපේක්ෂාව විය යුතුය. තිරසර සංවර්ධන වැඩසටහනක් යනු,
1 ස්ථිරසාර සංවර්ධන වැඩසටහන් දියත් කිරීමයි.
2. ස්ථිර ආර්ථික ප්‍රතිපත්තියක් සකස් කර සංවර්ධන වැඩසටහන් දියත් කිරීමයි.
3. මානව ජීවිතයේ ගුණාත්මකභාවය ඇති වන ආකාරයේ සංවර්ධන වැඩසටහන් දියත් කිරීමයි.
4. ඉදිරි පරම්පරාවට පරිභෝජනය සඳහා ඉතිරි වන අයුරින් සංවර්ධන වැඩසටහන් දියත් කිරීමයි.
5. දේශීය සම්පත් උපරිම ලෙස යොදා ගනිමින් සංවර්ධන වැඩසටහන් දියත් කිරීමයි.

36. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වූ සුරේෂ්ට රජය විසින් විදේශීය රටක් සමඟ අත්සන් කළ ගිවිසුමක් පිළිබඳ තොරතුරු දැනගැනීමට අවශ්‍ය වී ඇත. එම ගිවිසුම පිළිබඳ ව තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය ලබා දෙන්නේ,
1. බුද්ධිමය දේපළ පනත මගිනි.
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
3. තොරතුරු දැන ගැනීමේ පනත මගනි.
4. මානව හිමිකම් පනත මගිනි.
5. ප්‍රකාශන හිමිකම් පිළිබඳ පනත මගිනි.

37. ශ්‍රී ලාංකික සෑම පුරවැසියෙකුටම සිය නිදහස් මතය ප්‍රකාශ කිරීමට හා අදහස් පළ කිරීමට හිමිකමක් ඇත. එසේ වන්නේ එම අයිතිවාසිකම,
1. සදාචාරාත්මක අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇති බැවිනි.
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගෙන ඇති බැවිනි.
3. දණ්ඩ නීති සංග්‍රහයේ දක්වා ඇති බැවිනි.
4. මානව හිමිකමක් ලෙස දක්වා ඇති බැවිනි.
5. බුද්ධිමය දේපළ පනතේ දක්වා ඇති බැවිනි.

38. පහත වගුවේ දැක්වෙන්නේ කැමරා රූප රාමු හා දර්ශන කිහිපයකි.

| කැමරා රූප | දර්ශනය |
|---|---|
| 1. අති දුර රූපය | A. පොත පාඩම් කරමින් සිටින දරුවෙක් |
| 2. මධ්‍යම රූපය | B. රූපවාහිනී වැඩසටහනක ප්‍රවෘත්ති නිවේදකයෙක් |
| 3. අති සමීප රූපය | C. නිවස ඉදිරිපිට නවතා ඇති මෝටර් රථයක් |
| 4. සමීප රූපය | D. කාන්තාවකගේ මුහුණේ භීතිය ප්‍රකාශවන දර්ශනයක් |
| 5. දුර රූපය | E. නිවසේ හා ඉඩමේ පූර්ණ දර්ශනයක් |

ඉහත කැමරා රූපයට අදාළව ගැලපෙන දර්ශනය ඇති වරණය තෝරන්න.
1. 1 - E, 2 - B, 3 - D, 4 - A, 5 - C
2. 1 - B, 2 - A, 3 - D, 4 - C, 5 - D
3. 1 - E, 2 - D, 3 - D, 4 - A, 5 - B
4. 1 - C, 2 - E, 3 - D, 4 - B, 5 - A
5. 1 - C, 2 - A, 3 - D, 4 - E, 5 - B

39. ප්‍රසිද්ධ පාසලක විදුහල්පතිතුමියක් පිළිබඳව සාවද්‍ය තොරතුරු එක්තරා පුවත්පතක පල කර තිබුණි. ඒ සඳහා ඔහුට පැමිණිලි කළ හැක්කේ,
1. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයටයි.
2. ශ්‍රී ලංකා පුවත්පත් කර්තෘ සංසන්දයටයි.
3. ජනමාධ්‍ය අමාත්‍යාංශයටයි.
4. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමටයි.
5. පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමයටයි.

40. 'නවෝත්පාදන විසරණය' නැමැති න්‍යාය හඳුන්වා දෙනු ලැබුයේ ,
1. විල්බර් ශ්‍රාම් විසිනි.
2. එවරට් එම් රොජර්ස් විසිනි.
3. ඩඩ්ලි සියර්ස් විසිනි.
4. එඩ්ගා ඕවන්ස් විසිනි.
5. මහත්මා ගාන්ධිතුමා විසිනි.

41. සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා යන්නෙන් අදහස් වන්නේ,
1. සංවර්ධනය සඳහා සන්නිවේදනය යොදා ගත යුතු බවයි.
2. මානව අපේක්ෂාවන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් සංවර්ධන සැලසුම් සකස් කළ යුතු බවයි.
3. ගෝලීය සංවර්ධන අපේක්ෂා හඳුනා ගනිමින් සංවර්ධන සැලසුම් සකස් කළ යුතු බවයි.
4. රජයේ අපේක්ෂාවන් ඉටු වන අයරින් සන්නිවේදන අපේක්ෂා යොදා ගත යුතු බවයි.
5. ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය තුළින් සංවර්ධන ව්‍යාපෘති සන්නිවේදනය හරහා දියත් කළ යුතු බවයි.

42. ආයතනයක බාහිර මහජන සම්බන්ධතා ඇති කිරීම සඳහා මූලිකත්වය දරන්නේ,
1. මාධ්‍ය නිලධාරියා ය.
2. සිද්ධි කළමනාකරු ය.
3. ආයතයේ සේවකයන් ය.
4. කළමනාකරු ය.
5. සම්බන්ධීකරණ නිලධාරියා ය.

43. ලෝක මාධ්‍ය නියාමනය සඳහා භාවිතා කරන මූලික ප්‍රවේශයක් නොවන්නේ,
1. ස්වයං නියාමනයයි.
2. අභ්‍යන්තරික නියාමනයයි.
3. ව්‍යවස්ථාපිත නියාමනයයි.
4. සහ නියාමනයයි.
5. බාහිර නියාමනයයි.

44. විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු වූ කවිශ්ක ප්‍රසිද්ධ ලේඛකයෙකුගේ ග්‍රන්ථයක තිබූ ඡේදයක් ඒ අයුරින්ම තම නිබන්ධනයට ඇතුලත් කළේ ය. මෙය බුද්ධිමය දේපළ පනතට අනුව,
1. ආර්ථික අයිතිවාසිකම් උල්ලංගණය කිරීමකි.
2. සදාචාරාත්මක අයිතිවාසිකම් උල්ලංගණය කිරීමකි.
3. සාධාරණ භාවිතයට ගැනීමකි.
4. බුද්ධිමය දේපළ සොරා ගැනීමකි.
5. ආචාර ධර්මවලට පටහැනි ක්‍රියාවකි.

45. නිෂ්කර්ෂණය යනු ජනසන්නිවේදනයේ ප්‍රයෝජනයකි. නිෂ්කර්ෂණය යන්නෙන් අදහස් වන්නේ,
1. දැනුම ලබා ගැනීමයි.
2. විකල්ප වෙත යොමු වීමයි.
3. මානසික විඩාව දුරු කිරීමයි.
4. හුදෙකලා බව නැති කිරීමයි.
5 පුද්ගලයන්ගෙන් හා කාර්යයන්ගෙන් ඉවත් වී සිටීමයි.

46. 1927 දී ''ජනතාව හා ඔවුන්ගේ ගැටලු'' යන කෘතිය රචනා කරමින් සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයට දායකත්වය සැපයුවේ,
1. වෝල්ටර් ලිප්මාන් ය.
2. ජෝන් ඩුවී ය.
3. චාල්ස් කුලී ය.
4. විල්බර් ශ්‍රාම් ය.
5. ක්ලෝඩ් ෂැනෝන් ය.

47. දේශපාලනඥයන් විසින් වර්තමානයේ කඩිනම් මහජන සම්බන්ධතා ක්‍රමවේදයක් ලෙස භාවිතයට ගනු ලබන්නේ,
1. මාධ්‍ය සාකච්ඡා පැවැත්වීමයි.
2. මාධ්‍ය නිවේදන නිකුත් කිරීම
3. මහජන රැස්වීම් පැවැත්වීමයි.
4. සමාජ ජාල භාවිතා කිරීමයි.
5. දේශපාලන සංවාද වැඩසටහන් වලට සම්බන්ධ වීමයි.

48. පහත දැක්වෙන්නේ ජනමාධ්‍යවල පවතින ලක්ෂණ කිහිපයකි.
- තාක්ෂණික ක්‍රියාවලියක් හා බෙදා හැරීම් ජාලයක් පැවතීම.
- අර්ථ බාධක, මාධ්‍ය බාධක, හා පාරිසරික බාධක ඇතිවීම.
- සරල බව, හඬේ පෞරුෂය, ප්‍රාසාංගික බව, සුහදශීලී බව ප්‍රමුඛ වීම.

ඉහත සිදුවීම් වලට අදාළ මාධ්‍ය, පිළිවලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.
1. රූපවාහිනිය, පුවත්පත, ගුවන්විදුලිය
2. නව මාධ්‍ය, පුවත්පත, ගුවන්විදුලිය
3. පුවත්පත, සිනමාව, රූපවාහිනිය
4. පුවත්පත, රූපවාහිනිය, ගුවන්විදුලිය
5. පුවත්පත, ගුවන්විදුලිය, සිනමාව

49. නීතිමය බැඳීමක් ද සහිත ආචාර ධර්ම පද්ධතියක් පවත්වා ගෙන යනු ලබන්නේ,
1. පුවත්පත් මාධ්‍යයයි.
2. ගුවන්විදුලි මාධ්‍යයයි.
3. රූපවාහිනී මාධ්‍යයයි.
4. සිනමා මාධ්‍යයයි.
5. නව මාධ්‍යයයි.

50. මධ්‍යම සැලසුම් ගත, දළ දේශීය නිෂ්පාදනය සහ ඉතා දියුණු කාර්මික ව්‍යුහයක් සහිත ආර්ථිකයක් ඇති රටවල් වන්නේ,
1. චීනය හා සෞදි අරාබියයි.
2. කැනඩාව හා යුරෝපයයි.
3. කියුබාව හා චීනයයි.
4. කැනඩාව හා යුරෝපයයි.
5. සෞදි අරාබිය හා කැනඩාවයි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) සියලු සන්නිවේදන වර්ගයන්ගේ පදනම වන්නේ අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි. එහි ප්‍රයෝජන හතරක් දක්වන්න. **(ලකුණු 2)**
(ii) කාර්යාලීය කටයුතුවලදී ලිඛිත සන්නිවේදනය බහුල ව භාවිතා කෙරේ. එහි ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**
(iii) 'බෝ නොවන රෝග' පිළිබඳ ව පාසල් සිසුන් දැනුවත් කිරීමේ දේශනයේ දී වෛද්‍ය නිළධාරීතුමාට සිසු අවධානය ලබා ගැනීමට තරමක් අපහසු විය. එම තත්ත්වය මඟ හරවා ගැනීමට ඔහුට යොදා ගත හැකිව තිබූ උපක්‍රම තුනක් පැහැදිලි කරන්න. **(ලකුණු 6)**
(iv) වර්තමානයේ මාධ්‍ය භාවිතය තුළ සමාජ මාධ්‍ය වෙත වැඩි අවධානයක් යොමු වී ඇත. සමාජ මාධ්‍යයේ යහපත් බලපෑම් දෙකක් හා අයහපත් බලපෑම් දෙකක් ඇතුළත් කරමින් සඟරාවකට ලිපියක් ලියන්න. **(ලකුණු 8)**

02. (i) රූපවාහිනි මාධ්‍ය භාවිතය ළමයින්ගේ සමාජ සබඳතා දුරස් කිරීමට හේතු වී ඇති බව පර්යේෂණයක් මගින් අනාවරණය කර ගනු ලැබූයේ කවුරුන් විසින් ද? **(ලකුණු 2)**
(ii) සන්නිවේදන අධ්‍යයන විෂයයේ සංවර්ධනය සඳහා බලපෑ කරුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**
(iii) මාධ්‍ය සාක්ෂරතාවයේ දී විවිධ මානයන් මගින් තොරතුරු රැස් කිරීම සිදු වේ. එවැනි මානයන් හතරක් නම් කර දෙකක් උදාහරණය මගින් විස්තර කරන්න. **(ලකුණු 6)**
(iv) ගෝලීය සංස්කෘතියේ ලක්ෂණ ශ්‍රී ලංකාව තුළින් ද ගම්‍යමාන වේ. කරුණු හතරක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

03. (i) මාධ්‍ය සංදේශයක් තුළ අන්තර්ගත වන තොරතුරු වර්ග දෙකක් නම් කරන්න. **(ලකුණු 2)**
(ii) මාධ්‍ය සංදේශ විචාරය කිරීම සඳහා විවිධ දෘෂ්ටිවාද යොදා ගැනේ. එවැනි දෘෂ්ටිවාද දෙකක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**
(iii) නිර්මාණකරුවෙකුට නිර්මාණාත්මක රචනයේ දී අවශ්‍ය වන මූලිකාංග හතරක් නම් කර දෙකක් විස්තර කරන්න. **(ලකුණු 6)**
(iv) නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාවය කරුණු හතරක් මඟින් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

04. (i) පාසල් අධ්‍යාපනික සිද්ධි අවස්ථා දෙකක් නම්කරන්න. **(ලකුණු 2)**
(ii) මහජන සම්බන්ධතා ආයතනයක් වශයෙන් පාසල මහජන සම්බන්ධතාවය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**
(iii) ජනමාධ්‍යට සුවිශේෂ වූ කාර්ය භාරයයන් හතරක් නම් කර දෙකක් පැහැදිලි කරන්න. **(ලකුණු 6)**
(iv) ආයතන කළමණාකරුවෙකු වූ සරත් සිය කාර්යාලීය කටයුතුවලදී සිරුර බස (Body Language) යොදා ගනිමින් සන්නිවේදනයේ යෙදෙන ආකාර හතරක් විස්තර කරන්න. **(ලකුණු 8)**

05. (i) විදුලි සංදේශ නියාමන කොමිසම මඟින් සිදු කරන කාර්යයන් දෙකක් දක්වන්න. (ලකුණු 2)

(ii) දැන්වීම්කරණය හා මහජන සම්බන්ධතාවය අතර ඇති වෙනස්කම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) මාධ්‍ය නියාමනය කාලීන අවශ්‍යතාවයකි. කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iv) සිද්ධි කළමනාකරුවෙකු වශයෙන් ඔබ ත්‍යාග ප්‍රදානෝත්සව අවස්ථාවක් සැලසුම් කිරීමේ දී අනුගමනය කරන ක්‍රියාමාර්ග හතරක් විස්තර කරන්න. (ලකුණු 8)


06. (i) සංවර්ධනය පිළිබඳ ඩඩ්ලි සියර්ස් ඉදිරිපත් කළ නිර්වචනය ලියන්න. (ලකුණු 2)

(ii) ලාංකික සමාජය තුළ පවතින දරිද්‍රතාවය පිටු දැකීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) ජනශ්‍රැති හා ජනකලා නූතන නිර්මාණකරණය තුළ යොදා ගෙන ඇති ආකාරය අවස්ථා තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 6)

(iv) මාධ්‍ය මඟින් සංස්කෘතියට කර ඇති බලපෑම කරුණු හතරක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 8)

07. (i) පහත සඳහන් ෂැනොන් හා වීවර් ආකෘතියේ A, B, C, D අංග නම් කරන්න. (ලකුණු 2)




(ii) සංවර්ධන සංකල්පයේ නව ප්‍රවණතා දෙකක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 4)

(iii) පුවත්පත් ආචාර ධර්ම තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(iv) සංවර්ධන ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ගැටලු හතරක් නිදසුන් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 8)

## දෙවන වාර පරීක්ෂණය - 2020 - 13 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## I කොටස

### පිළිතුරු පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 3 | **11.** - 3 | **21.** - 1 | **31.** - 4 | **41.** - 2 |
| **02.** - 2 | **12.** - 1 | **22.** - 5 | **32.** - 2 | **42.** - 1 |
| **03.** - 5 | **13.** - 5 | **23.** - 4 | **33.** - 1 | **43.** - 5 |
| **04.** - 4 | **14.** - 2 | **24.** - 2 | **34.** - 1 | **44.** - 3 |
| **05.** - 5 | **15.** - 2 | **25.** - 3 | **35.** - 4 | **45.** - 5 |
| **06.** - 1 | **16.** - 3 | **26.** - 2 | **36.** - 3 | **46.** - 2 |
| **07.** - 3 | **17.** - 4 | **27.** - 3 | **37.** - 2 | **47.** - 4 |
| **08.** - 2 | **18.** - 5 | **28.** - 3 | **38.** - 1 | **48.** - 4 |
| **09.** - 4 | **19.** - 1 | **29.** - 4 | **39.** - 4 | **49.** - 1 |
| **10.** - 4 | **20.** - 3 | **30.** - 5 | **40.** - 2 | **50.** - 3 |

## II කොටස පිළිතුරු

01. (i) පෞරුෂ වර්ධනය / ස්ව සංකල්පය පෝෂණය / මතක තබා ගැනීම / තීරණ ගැනිම / නිර්මාණකරණය / චින්තනය ගොඩනංවා ගැනීම / විචාරශීලීත්වය වර්ධනය **(ලකුණු 1x 2 = 2)**

(ii) සාක්ෂරතාවය අවශ්‍ය වීම / කථන සන්නිවේදනයට වඩා සංවිධානාත්මක වීම / තොරතුරු ගබඩා කර තබා ගත හැකිවීම. **(ලකුණු 2x 2 = 4)**

(iii) තාක්ෂණික උපකරණ භාවිතය / ප්‍රදීපාගාර උපක්‍රමය යොදා ගැනීම / අරමුණු සහගතව කථා කිරීම / ආකර්ෂණීය කථන විලාසය / කාලය කළමනාකරණය කිරීම / ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය **(ල. 2x 3 = 6)**

(iv) යහපත් බලපෑම් - අන්තර්ගතය සංස්කරණය කළ හැකිවීම / ග්‍රාහකයාට කැමති ලෙස පරිශීලනය කළ හැකිවීම / දැනුම හුවමාරු කර ගැනීමට හැකිවීම.
ව්‍යාපාරික කටයුතු සඳහා යොදාගත හැකිවීම ආදිය
අයහපත් බලපෑම් - ගැඹුරු මානසික හා සමාජීය කම්පන ඇති කිරීම / පෞද්ගලිකත්වය පිළිබඳ ගැටලු ඇතිවීම / ප්‍රචණ්ඩ ක්‍රියවලට පෙළඹවීම / වැරදි තොරතුරු පළ කිරීම ආදිය **(ලකුණු 2x 2 = 4)**

02. (i) විල්බර් ශ්‍රාම් විසින් **(ලකුණු 2)**

(ii)
- චාල්ස් කුලී, වෝල්ටර් ලිප්මාන් වැනි විද්වතුන් විසින් කෘති සම්පාදනය කිරීම.
- හිට්ලර් විසින් එරට විශ්වවිද්‍යාලවලින් පිටමං කරනු ලැබූ විද්වතුන් විශාල ප්‍රමාණයක් ඇමරිකානු විශ්ව විද්‍යාල වලට කේන්ද්‍රගත වී සන්නිවේදන අධ්‍යයන විෂයය පිළිබඳව අධ්‍යයනය කිරීම හා පර්යේෂණ කිරීම.
- විල්බර් ශ්‍රාම් විසින් සන්නිවේදන අධ්‍යයන ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් ලෙස ආයතන ගත කිරීම.

**(ලකුණු 2x 2 = 4)**

(iii) සංජානන මාන / චිත්තවේගීය මාන / සෞන්දර්යය මාන / සදාචාරත්මක මාන

**නම් කිරීමට ලකුණු 2 විස්තර කිරීමට ලකුණු 2x 2 = 4 )**

(iv) පරිභෝජන රටාව වෙනස් වීම / විලාසිතා සංස්කෘතිය වෙනස් වීම / ආහාර සංස්කෘතිය වෙනස් වීම / අධ්‍යාපන සංස්කෘතිය වෙනස් වීම / චින්තන සංස්කෘතිය වෙනස් වීම.

**(උදාහරණ සහිතව පැහැදිලි කිරීමට ලකුණු 8)**

03. (i) තත්ත්ව තොරතුරු (යථා තොරතුරු) හා සමාජ තොරතුරු **(ලකුණු 2)**

(ii) මාක්ස්වාදී විචාරය - ධනේශ්වර සමාජයේ අවශ්‍යතා හා වරප්‍රසාද ලබන නිර්මාණ විචාරය කිරීම සඳහා මෙය යොදා ගනියි.
මනෝවිශ්ලේෂණවාදී විචාරය - පුද්ගල මනස කෙරෙහි බලපෑම් කරන සංදේශ, වෙළඳ දැන්වීම් ආදිය විචාරයට ලක් කිරීමේ දී මෙම විචාර ක්‍රමය යොදා ගනියි.
ස්ත්‍රීවාදී විචාරය - මාධ්‍ය සංදේශ තුළින් ස්ත්‍රී අයිතිවාසිකම් කෙතරම් දුරට ආරක්ෂා වන්නේ ද යන්න මෙම විචාර ප්‍රවේශය ඔස්සේ සිදු වේ. **(ලකුණු 4)**

(iii) ඉන්ද්‍රිය සංවේදන / පරිකල්පනය / ප්‍රත්‍යක්ෂණය / සංජානනය / අත්දැකීම් ප්‍රතිචින්දනය / ප්‍රස්තුත ගවේෂණය / සතතාභ්‍යාසය / ශිල්පීය කුසලතා භාවිතය

**නම් කිරීමට (ලකුණු 1/2x 4 = 2) විස්තර කිරීමට (ලකුණු 2 x 2 = 4 මුළු ලකුණු 06)**

(iv)
- වෘත්තීය ජීවිතය හා දෛනික ජීවිතය ශක්තිමත් කර ගැනීමට හා ප්‍රබෝධමත් කර ගැනීම.
- අවිවේකී හා සංකීර්ණ වත්මන් ස්වභාවයෙන් මිදීමට
- සම්මත ඇවතුම් පැවතුම්වලින් යුතු අක්‍රිය පුරවැසියා නව සක්‍රිය පුරවැසියෙකු බවට පත් කිරීමට
- ගැඹුරු සංකල්ප, දර්ශනවාද පහසුවෙන් අවබෝධ කර ගැනීමට
- සැම සන්නිවේදන වර්ගයක් තුළ සිටින සන්නිවේදකයා ප්‍රබල සන්නිවේදකයෙකු බවට පත්වීමට ආදිය

**(ලකුණු 2 x 4 = 8)**

NWP-EXAM

04. (i) ශිෂ්‍යනායක දින / ත්‍යාග ප්‍රදානෝත්සව / අධ්‍යාපන චාරිකා / ආගමික වැඩසටහන් / අධ්‍යාපනික ප්‍රදර්ශන / සාහිත්‍ය උත්සව ආදිය **(ලකුණු 2)**

(ii) ශිෂ්‍යත්ව , සා.පෙළ, උසස් පෙළ ප්‍රතිඵල ඉහළ නැංවීම
උත්සව, ශ්‍රමදාන පැවැත්වීම අලංකාර පරිසරයක් නිර්මාණය කිරීම ආදිය **(ලකුණු 2 x 2 = 4 )**

(iii) සුපරීක්ෂණය / අර්ථ කථනය / සහසම්බන්ධය / සමාජානුයෝජනය
**(නම් කිරීමට 1/2 x 4 = 2 විස්තර කිරීමට 2 x 2 = 4 ලකුණු 6)**

(iv) අංග චලනය / මුහුණේ ඉරියව් / ඇස් සම්බන්ධතාවය / ඉඟි ඇඟවුම්පැළඳුම් / පරතරය **(ලකුණු 2 x 4 = 8)**

05. (i) විදුලි සංදේශ සේවා සැපයීමේ දී ඊට අදාළ උපාංගවල ගුණාත්මකභාවය පිළිබඳ කටයුතු කිරීම / නව විදුලි සංදේශ ක්‍රමෝපායන් වර්ධනය කිරීම / විද්‍යුත් මාධ්‍ය සඳහා සංඛ්‍යාත පද්ධති බෙදා දීම / දුරකතන භාවිත ගැටලු සඳහා විසඳුම් ලබාදීම ආදිය **(ලකුණු 1 x 2 = 2)**

(ii) මහජන සම්බන්ධතාවය කළමනාකරන කාර්යයක් වන අතර දැන්වීම්කරණය අලෙවිකරණ කාර්යයකි.
මහජන සම්බන්ධතාවය සඳහා ජනමාධ්‍ය හා යන්ත්‍ර සහායක සන්නිවේදන ක්‍රම යොදා ගන්නා අතර දැන්වීම්කරණය සඳහා ජනමාධ්‍ය යොදා ගනියි.
මහජන සම්බන්ධතාවය සඳහා මුදලක් වැය නොවන අතර දැන්වීම්කරණය සඳහා මුදලක් වැය වෙයි.
**(ලකුණු 2 x 2 = 4)**

(iii) තොරතුරු ලබා දෙන විවිධ සන්නිවේදන ක්‍රම ආර්ථික සම්පතක් වීම.
මහජන සාමය ආරක්ෂා කර ගැනීම.
පාලනය නොකරන ලද පොදු මහජන සන්නිවේදන ක්‍රම මගින් තනි පුද්ගලයන්ගේ අයිතීන්වලට සිදුවන බලපෑම් පාලනය කිරීමට
මාධ්‍ය සේවාවල නිදහස් වෙළඳ පළ භාවිතය, ප්‍රවේශවීමේ තරඟකාරීත්වය, පාරිභෝගික අයිතීන් පවත්වා ගෙන යාමට
සන්නිවේදන මාධ්‍යයන්ගේ නිදහස, විවිධත්වය, විශ්වීය වටිනාකම් ප්‍රවර්ධනයට **(ලකුණු 2 x 3 = 6)**

(iv) ත්‍යාගලාභී නාම ලේඛන සැකසීම
ත්‍යාග සඳහා මූල්‍ය පිරිවැය ගණනය කිරීම
පවත්වන ස්ථානය හා දිනය තීරණය කිරීම
ආරාධිත අමුත්තන් තීරණය කිරීම
ආරාධනා පත්‍ර සැකසීම හා ආරාධනා කිරීම
උත්සවයේ විවිධ කාර්යයන් සඳහා කමිටු බෙදා දැක්වීම හා වැඩ පැවරීම ආදිය **(ලකුණු 2 x 4 = 8)**

06. (i) 'සංවර්ධනය යනු රටක දුප්පත්කම, අසමානතාවය හා විරැකියාව අඩු කිරීම හෝ අහෝසි කිරීමයි.'
- ඩඩ්ලි සියර්ස් - **(ලකුණු 2)**

(ii) ස්ථිරසාර ජීවනෝපාය ක්‍රම, ව්‍යවසායික අවස්ථා හා ඵලදායි සම්පත් භාවිතය සඳහා ප්‍රවේශ අවස්ථා වැඩි දියුණු කිරීම.
ස්ව ශක්තියෙන් නැගී සිටීමට නොහැකි අයට උපකාර කිරීමේ ප්‍රවේශ අවස්ථා වැඩි දියුණු කිරීම - උදා. ස්වයං රැකියා සඳහා ණය දීම ආදිය.
දරිද්‍රතාවයෙන් ජීවත් වන ජනතාව හා එයින් මුදවා ගැනීමට පිහිටුවා ඇති සංවිධානය බල ගැන්වීම - සමෘද්ධි සමිති,
ගොවි සංවිධාන ආදිය
දරිද්‍රතාවයේ බලපෑම්වලට ගොදුරු වන කාන්තාවට විසඳුම් ලබා දීම - උදා:- ස්වයං රැකියාවලට පෙළඹවීම ආදිය **( ලකුණු 2 x 2 = 4)**

(iii) නූතන ගීත නිර්මාණය / චිත්‍රපට ටෙලි නාට්‍ය දර්ශනවලට / පහන්, තොරණ් නිර්මාණකරණයට / වෙළඳ දැන්වීම් නිර්මාණයට කාලීන නිදසුන් දක්වා තිබිය යුතුය. **(ලකුණු 2 x 3 = 6)**

(iv) පුද්ගල ආකල්ප / හැසිරීම් / ප්‍රචණ්ඩත්වය / සංස්කෘතික කම්පනය / රසවින්දනය කෙරෙහි බලපා ඇති ආකාරය විස්තර කළ යුතුයි. **(ලකුණු 2 x 4 = 8)**

07. (i) A - තොරතුරු මූලාශ්‍රය B - සම්ප්‍රේෂකය C - ඝෝෂා / බාධා D - සංදේශාන්තය
**(නම් කිරීමට 1/2 x 4 = 2)**

(ii) ඉහළ සිට පහළට පැවති සංවර්ධන සන්නිවේදන ප්‍රවේශය වෙනස් වීම.
දරිද්‍රතාවයට විසඳුමක් ලෙස ධනේශ්වර සාරධර්ම ව්‍යාප්ත කිරීම මගින් කොමියුනිස්ට් වාදයේ ව්‍යාප්තිය අඩු කිරීමට යෝජනා කිරීම.
පරායත්ත න්‍යාය හඳුන්වා දීම (දියුණු රටවල ආර්ථික මත යැපීමෙන් නොදියුණු රටවල් දියුණු කර ගැනීම කළ හැකි බව මෙයින් පෙන්වා දෙන ලදී.
නවෝත්පාදන විසිරණ න්‍යාය හඳුන්වා දීම.
සංවර්ධනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ආදී කරුණු **(නම් කිරීමට 2 x 2 = 4)**

AWP-EXAM

(iii) නිවැරදි හා සත්‍ය තොරතුරු පළ කිරීම.

තොරතුරු ලබා දෙන පුද්ගලයන්ගේ අනන්‍යතාවය හෙළි කිරිමට බලය ලබා දෙන්නේ නම් මිස එම තොරතුරු ලබා ගත් ප්‍රභවයන් පිළිබඳ රහස්‍යතාවය ආරක්ෂා කළ යුතු වීම.

මහජන යහපත උදෙසා වන්නේ නම් මිස පුද්ගලයෙකුගේ කීර්ති නාමයට හානි පමුණ වන තොරතුරක්, මත දැක්වීමක්, වාර්තා නොකළ යුතු විම.

අපරාධ නඩු පිළිබඳ වාර්තා කිරිමේ දී ලිංගික අපරාධවලට භාජනය වූවන්ගේ නම්, සාපරාදී වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ වයස අවුරුදු 18 ට අඩු හා පෙර වරදකරුවන් කරනු නොලැබූ තැනැත්තන්ගේ නම් ඉදිරිපත් කිරිමෙන් වැළකිය යුතුවීම. එසේ ම සාපරාධී කරුණු සම්බන්ධයෙන් චෝදනා ලැබූ හා වරදකරුවන් වාර්තා කිරීමෙන් වැළකිය යුතු වීම.

අන්‍යයන්ගේ අදහස් හා ලිපි තමාගේ නමින් පළ කිරිමෙන් වැළකිය යුතු වීම.

පරපීඩා, කාමුකත්වය, සැහැසිකම් හෝ සල්ලාලකම් ප්‍රවර්ධනය කෙරෙන ආකාරයේ ලිපි පළ කිරීමෙන් වැළකීම. එමෙන්ම අසභ්‍ය දෑ පළ කිරීමෙන් වැලකීම.

ජාතිවාදී හා ආගම්වාදී හෝ හිංසන ක්‍රියා ප්‍රවර්ධනය කරන තොරතුරු වාර්තා කිරීමෙන් වැලකීම.

**(ලකුණු 2 x 3 = 6)**

(iv) දේශපාලන අස්ථාවරභාවය

ස්ථිර ආර්ථික ප්‍රතිපත්තියක් නොමැති වීම.

වංචා දූෂණ, අල්ලස් ගැනීම් හා කොමිස් ගැනීම් ඉහළ මට්ටමකින් සිදුවීම.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ආයතනවලට අනුව ක්‍රියාකිරීමට සිදුවීම.

ආකල්පමය හා සංස්කෘතිමය ගැටලු

නිදසුන් මගින් පැහැදිලි කර තිබිය යුතුය. **(ලකුණු 2 x 4 = 8)**

NWP - EXAM

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440